# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2022/14 - 2017 ජුනි මස 06 වැනි අඟහරුවාදා - 2017.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 23 (2) වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2017 අංක 02 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමෙන් පසුව බලාත්මක විය යුතු ය.

2. 2015 ජූනි මස 9 වැනි දින අංක 1918/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත 1990 ජනවාරි මස 05 වැනි දින අංක 591/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලියේ 16 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි (3) වන අනු ඡේදයෙහි (iv) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමයන් ආදේශ කිරීමෙන් :-

"(iv) ගණිතය ;

(v) පරිගණක විද්‍යාව ; " ; සහ

(ආ) එහි (3) වන අනු ඡේදයෙහි (v), (vi) සහ (vii) යන අයිතමයන් පිළිවෙලින් එම අනු ඡේදයේ (vi), (vii) සහ (viii) යන අයිතමයන් වශයෙන් නැවත අංකනය කිරීමෙන්.

06 - 744


1A - PG 3549 — 157 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*